මඩකලපුව දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 17 - 2024

---

1. විගණන මතය

1.1 මඩකලපුව දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 17 ක 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 2024 වර්ෂයට අදාලව මඩකලපුව දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 17 කට අදාලව විගණන වාර්තා නිකුත් කර තිබුණු අතර, එම විගණන වාර්තා 17 සඳහාම තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි. එම මතයන් සඳහා හේතුවී තිබුණු ප්‍රමාණාත්මක නිරීක්ෂණයන් පහත දැක්වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගොවිජන සේවා කාරක සභා 17 කට අයත් ඉඩම්, කාර්යාල ගොඩනැගිලි, පොහොර ගබඩා සහ අලෙවි මධ්‍යස්ථානවල වටිනාකම ඇස්තමේන්තු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.	වත්කම් අත්පත් කර ගැනීමෙන් මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම තක්සේරු කිරීමට කටයුතු කරමි.	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා ගෙන සියලුම ස්ථාවර වත්කම් සාධාරණ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල හෙළි කිරීමට පියවර ගත යුතුය
(ආ)	ගොවිජන සේවා කාරක සභා 03 ක ගෘහ භාණ්ඩ, කාර්යාල උපකරණ හා යන්ත්‍රෝපකරණ 87 ක වටිනාකම ඇස්තමේන්තු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.	යථා කාලයේ දී, වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කරමි.	- එම -
(ඇ)	කොක්කට්ටිචෝලෙයි ගොවිජන සේවා කාරක සභාවේ ගොඩනැගිල්ල සහ ඉඩමෙහි වටිනාකම රු.4,579,525 ක් සහ වන්දාරුමූලයි ගොවිජන සේවා කාරක සභාව වෙතින් සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබුණු යන්ත්‍රෝපකරණ සහ උපකරණවල වටිනාකම රු.176,750 ක් ප්‍රාග්ධනීකරණය කර වත්කම්වලට ඇතුළත් කර නොතිබුණි.	ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි.	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි එම වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය.

(ඇ)	ගොවිජන සේවා කාරක සභා 03 ක 2016 වර්ෂයේ දී එකතුව රු.988,911 ක වියදමින් නිම කරන ලද හරිතාගාර, යකඩ කූඩාරම සහ ඉදිකිරීම් ගිණුම්ගත කර නොතිබුණි.	- එම -	- එම -
(ඉ)	පලුකාමම් ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිසංස්කරණය කරන ලද කාර්යාල ගොඩනැගිල්ලේ වටිනාකම රු.2,781,193 ක් මූල්‍ය ප්‍රකාශනයේ ස්ථාවර වත්කම් ලෙස ඇතුළත් කර නොතිබුණි.	ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි.	මූල්‍ය ප්‍රකාශනවල වත්කම් හෙළිදරව් කිරීමට පියවර ගත යුතුය.
(ඊ)	ජපන් ආධාර ව්‍යාපෘතිය යටතේ වාකරයි ගොවිජන සේවා කාරක සභාවට ලැබී 2008 සහ 2010 වර්ෂයන්හි දී ගොවීන් 11 දෙනෙකු වෙත ණය පදනම මත ලබා දී තිබූ රෝද දෙකේ ට්‍රැක්ටර් රථ සඳහා ඔවුන්ගෙන් අයකර ගත යුතු රු.1,407,000 ක ණය මුදල මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.	යථා කාලයේ වාර්තා කිරීමට කටයුතු කරමි.	ලැබිය යුතු ආදායම නිසි ලෙස සටහන් කිරීමටත්, ඒවා කාලීනව අයකර ගැනීමටත් පියවර ගත යුතුය.
(උ)	කරඩියනාරු ගොවිජන සේවා කාරක සභාවේ ස්ථාවර තැන්පතුවල මූල්‍ය වර්ෂය සඳහා පොලී ආදායම රු.72,238 කින් අඩුවෙන් දක්වා තිබුණි.	2025 දී මෙය නිවැරදි කිරීමට කටයුතු කරමි.	ආදායම නිසි ලෙස ගණනය කිරීමට පියවර ගත යුතු අතර, ගිණුම් නිවැරදි කළ යුතුය.
(ඌ)	ආයිත්තියමලයි සහ වාලයිචේනයි ගොවිජන සේවා කාරක සභාවල සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාවර තැන්පතු සඳහා වූ පොලී ආදායම රු.873,577 ක් වූ අතර, එය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය කටයුතුවලින් ලැබෙන මුදල් ප්‍රවාහ ලෙස වර්ගීකරණය කර නොතිබුණි.	ඉදිරි වර්ෂයේ දී මෙය නිවැරදි කිරීමට කටයුතු කරමි.	මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සුදුසු වර්ගීකරණය යටතේ සකස් කිරීමට පියවර ගත යුතුය.
(එ)	වාලයිචේනයි ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ, මුදල් සහ මුදල් සමාන දෑ ආරම්භක ශේෂය සහ පෙර වසරේ අවසන් ශේෂය අතර රු.483,216 ක වෙනසක් පැවතුණි.	නිවැරදි කිරීමට කටයුතු කර ඇත.	සැසඳීම් සිදුකර මුදල් ප්‍රවාහ ප්‍රකාශය සුදුසු ලෙස නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඒ)	මණ්ඩපත්තඩි ගොවිජන සේවා කාරක සභාවේ 2024 වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ස්ථාවර තැන්පතු සඳහා පොලී ආදායම රු. 701,547 කින් අඩුවෙන් දක්වා තිබුණි.	- එම -	විධිමත් පරිදි පරීක්ෂා කර ගිණුම් නිවැරදි කිරීමට පියවර ගත යුතුය.
(ඔ)	මණ්ඩපත්තඩි ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ ණයගැතියන්ගෙන් ලද	- එම -	- එම -

	රු.4,153,295 ක් ණයගැතියන්ගෙන් ලද මුදල් ලෙස දක්වා නොතිබූ අතර, එය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ වෙනත් ආදායම් යටතේ දක්වා තිබුණි.		
(ඕ)	ආයිත්තියමලයි ගොවිජන සේවා කාරක සභාවේ මතභේදාත්මක ඉඩමක් බදු දීමෙන් ලද රු.1,603,616 ක බදු මුදල ආදායම් ලෙස ගිණුම්ගත නොකර මූල්‍ය ප්‍රකාශනවල වගකීමක් ලෙස දක්වා තිබුණි.	ඉදිරි වර්ෂයේදී මෙය ජංගම නොවන වගකීම් යටතේ දැක්වීමට කටයුතු කරමි.	විධිමත් අධ්‍යයනයක් කර ගිණුම්වල නිසි ගැලපීම් සිදු කිරීමට පියවර ගත යුතුය.
(ක)	කල්ලඩි ගොවිජන සේවා කාරක සභාවට 2020 දී ලැබුණු තත්ත්ව පාලනාගාර යන්ත්‍ර සහ උපකරණ 117 ක් සම්බන්ධයෙන් පෙර වර්ෂය සඳහා රු.533,301 ක් සහ සමාලෝචිත වර්ෂය සඳහා රු.143,460 ක් වන ක්ෂය වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කර ඇත.	ගිණුම්වල නිසි ගැලපීම් සිදු කිරීමට පියවර ගත යුතුය.
(ග)	වෙල්ලාවලි ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂය තුළ ඇති වූ ගංවතුර හේතුවෙන් රු.231,000 ක් වටිනා TSP රසායනික පොහොර මලු 22 ක් විනාශ වීමේ අලාභය සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර, එය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	ඉදිරි වර්ෂයේ දී මෙය නිවැරදි කිරීමට කටයුතු කරමි.	විධිමත් පරිදි කටයුතු කර මූල්‍ය ප්‍රකාශනවල අලාභය හෙළිදරව් කිරීමට පියවර ගත යුතුය.
(ච)	පලුකාමම් ගොවිජන සේවා කාරක සභාවේ 2019 වර්ෂයේ දී පොහොර සහනාධාර ගිණුමෙන් ගොවිජන බැංකු ගිණුමට මාරු කරන ලද රු.600,000 ක වටිනාකම සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මූල්‍ය ප්‍රකාශනවල වත්කමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.	- එම -	විධිමත් පරීක්ෂාවක් සිදු කර වත්කම් නිසි ආකාරයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට පියවර ගත යුතුය.
(ජ)	කිරාන් ගොවිජන සේවා කාරක සභාව විසින් වසර 02 කට පෙර බැහැර කරන ලද රු.1,150,000 ක් වටිනා ට්‍රැක්ටර් රථයේ වටිනාකම වත්කම් ගිණුමෙන් ඉවත්කර නොතිබුණි.	- එම -	විධිමත් පරීක්ෂාවක් කර මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට පියවර ගත යුතුය.

1.3.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ගොවිජන සේවා කාරක සභා ගිණුම් ශේෂ 10 ක එකතු වටිනාකම රු.31,951,543 ක තහවුරු කිරීම සඳහා විගණනය වෙත ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කර නොමැති	ණය ගැති ලේඛනය, ඉන්වොයිසි, තහවුරු කිරීමේ ලිපි සහ සවිස්තරාත්මක කාලසටහන් ආදිය ඉදිරිපත්	ගිණුම් ශේෂ තහවුරු කිරීම සඳහා විගණනයට ඉල්ලූ සියළුම සාක්ෂි

නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය/ සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.	කිරීමට කටයුතු කරමි.		ඉදිරිපත් කළ යුතුය.

1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත			
	(i) 44 (1) වගන්තිය	සියලුම ගොවිජන සේවා කාරක සභාවල ගිණුම් ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්ගේ බලයලත් නිලධාරි විසින් පරීක්ෂා කළ යුතු බව සඳහන් කර තිබුණ ද, ගොවිජන සේවා කාරක සභා 06 ක ගිණුම් එම පනතේ විධිවිධාන ප්‍රකාරව පරීක්ෂා කර නොතිබුණි.	සියලුම ගොවිජන සේවා කාරක සභා ගිණුම් පරීක්ෂා කිරීමට ඉදිරියේ දී කටයුතු කරමි.	පනතේ විධිවිධාන අනුව පියවර ගත යුතු අතර, අනුකූල නොවූ පාර්ශව වෙත පියවර ගත යුතුය.
	(ii) 55 (1) වගන්තිය	ආරයම්පති ගොවිජන සේවා කාරක සභාව විසින් කුඹුරු ඉඩම් මැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.	ඉදිරියේදී ඉඩම් මැනීමට කටයුතු කරමි.	- එම -
(ආ)	2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ) පනත	ගොවිජන සේවා කාරක සභා 03 ක රු.25,000 ඉක්මවන ගෙවීම් සඳහා මුද්දර ගාස්තු අය කරගෙන නොතිබුණි.	ඉදිරියේදී මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කරමි.	- එම -
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි			
	(i) මු.රෙ. 102 – 110	2008 වර්ෂයේ දී ඇති වූ කළබලකාරී තත්ත්වය හේතුවෙන් එරාවූර් ගොවිජන සේවා කාරක සභාවට අයත් රු.459,562 ක් වටිනා වත්කම් 66 සම්බන්ධයෙන් පොලිසියට පැමිණිල්ලක් කර තිබුණද, ඒවා කපා හැරීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	නියෝජ්‍ය කොමසාරිස්ගේ අනුමැතිය ඇතිව ඉදිරි වර්ෂවලදී ඒවා කපා හැරීමට කටයුතු කරමි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, අනුකූල නොවූ පාර්ශව වෙත පියවර ගත යුතුය.

(ii)	මු.රෙ. 110	ගොවිජන සේවා කාරක සභා 07 ක හානි හා පාඩු සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.	ඉදිරියේ දී හානි හා පාඩු ලේඛනයක් පවත්වා ගෙන යාමට කටයුතු කරමි.	- එම -
(iii)	මු.රෙ. 137 සහ 225	වන්දාරුමූලයි ගොවිජන සේවා කාරක සභාව විසින් සමාලෝචිත වර්ෂය තුළ රු.1,610,000 ක් වටිනා යූරියා මිලදී ගැනීම වෙනුවෙන් වියදම් වවුචරයක් සකස් කර බලයලත් නිලධාරියෙකු විසින් අනුමත කිරීමකින් තොරව අදාළ මුදල් පොහොර සමාගම වෙත ගෙවා තිබුණි.	ඉදිරියේදී මෙවැනි වැරදි සිදු නොවීමට කටයුතු කරමි.	- එම -
(iv)	මු.රෙ. 384 (2)	වෙල්ලාවෙලි ගොවිජන සේවා කාරක සභාව විසින් චෙක්පත් නිකුත් කිරීමේ ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.	ඉදිරියේ දී මෙම ලේඛන පවත්වාගෙන යාමට කටයුතු කරමි.	- එම -
(v)	මු.රෙ. 452 (1) - (2)	කොක්කඩිච්චෝලයි සහ තාන්තාමලයි ගොවිජන සේවා කාරක සභා විසින් විගණන විමසුම් ලේඛනයක් සහ විදුලි උපකරණ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.	- එම -	- එම -
(vi)	මු.රෙ. 502(2)	කාත්තාන්කුඩි සහ එරාවූර් ගොවිජන සේවා කාරක සභා විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබූ අතර, ඒවා භෞතිකව පරීක්ෂා කිරීමක් ද සිදුකර නොතිබුණි.	- එම -	- එම -
(vii)	මු.රෙ. 891	ගොවිජන සේවා කාරක සභා 15 ක් විසින් ඇප ලේඛනයක් නඩත්තු කිරීමට කටයුතු කර නොතිබුණි.	- එම -	- එම -
(viii)	මු.රෙ. 756 (6) සහ රාජ්‍ය මූල්‍ය ච.ලේ. අංක 01/2020	ගොවිජන සේවා කාරක සභා 12 ක් විසින් තොග සම්බන්ධයෙන් වාර්ෂික විගණන වාර්තාව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර	මින් ඉදිරියට, වාර්ෂික සමීක්ෂණ වාර්තාව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු	- එම -

		නොතිබුණි.	කරමි.	
(ඇ)	2018 අප්‍රේල් 20 දිනැති අංක 5/2018 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය	ගොවිජන සේවා කාරක සභා 10 ක් විසින් එම බල ප්‍රදේශවල ඇති ගොඩ ඉඩම් පිළිබඳ ලේඛනයක් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි.	ගොඩ ඉඩම්, ගොඩ ඉඩම් ලේඛනයට ඇතුළත් කර ලේඛනය නඩත්තු කිරීමට ඉදිරියේ දී කටයුතු කරමි.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, අනුකූල නොවූ පාර්ශව වෙත පියවර ගත යුතුය.
(ඉ)	2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 භාණ්ඩාගාර චක්‍රලේඛය	ගොවිජන සේවා කාරක සභා 08 ක් විසින් පරිගණක සහ පරිගණක උපාංග සම්බන්ධයෙන් ලේඛනයක් නඩත්තු කිරීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී මෙම ලේඛන නඩත්තු කිරීමට කටයුතු කරමි.	- එම -
(ඊ)	1979 අංක 58 දරන ගොවිජන සේවා පනත යටතේ වන අංක 107 දරන චක්‍රලේඛය 15 වන වගන්තිය	ගොවිජන සේවා කාරක සභා 05 ක් විසින් පොදු ලෙජරය සහ දින සටහන් නඩත්තු කිරීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරියේ දී පොදු ලෙජරය සහ දින සටහන් නඩත්තු කිරීමට කටයුතු කරමි.	- එම -
(උ)	2020 ජුනි 25 දිනැති අංක 08/2020 දරන ගොවිජන සංවර්ධන චක්‍රලේඛය	ගොවිජන සේවා කාරක සභා 11 ක් විසින් මුදල්, ගබඩා සහ චෙක්පත් අත්සන් කිරීම වැනි ආදායම් එකතු කිරීමේ කටයුතුවල නිරත වන නිලධාරින්ගෙන් ඇප මුදල් ලබාගෙන නොතිබුණි.	අදාළ නිලධාරින්ගෙන් ඇප මුදල් ලබා ගැනිමට කටයුතු කරමි.	- එම -

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

(අ) සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 17 ක මෙහෙයුම් ප්‍රතිඵලය රු.878,666 ක ශුද්ධ ඌනතාවයක් වූ අතර, එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු.27,149,231 ක් විය. ඒ අනුව, මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.28,027,897 ක ශුද්ධ පිරිහීමක් දක්නට ලැබුණි. මෙම පිරිහීමට කෘෂිකාර්මික ඉඩම් සඳහා වන අක්කර බදු ආදායම, පොහොර අලෙවිය සහ ස්ථාවර තැන්පතු වලින් ලැබෙන පොලී ආදායම අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ගොවි බැංකු 17 ක මෙහෙයුම් ප්‍රතිඵලය රු.948,655 ක අතිරික්තයක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.5,523,305 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,574,650 ක පිරිහීමක් දක්නට ලැබුණි. කෘෂිකාර්මික ණය වලින් ලැබෙන පොලී ආදායම අඩුවීම සහ මණ්ඩපත්තඩි සහ එරාවූර් ගොවිජන බැංකු වල සිදු කරන ලද මූල්‍ය වංචාවන් මෙම පිරිහීමට ප්‍රධාන හේතුව වී තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගොවිජන සේවා කාරක සභා 12 ක් පිහිටා ඇති ඉඩම් වල හිමිකම අත්පත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි ඉඩම අත්පත් කර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	මණ්ඩපත්තඩි ගොවිජන සේවා කාරක සභාව විසින් සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් රු.2,895,000 වටිනා යූරියා පොහොර මලු 150 න් සියයට 99 ක් විගණිත දිනය වන 2025 ජුනි 09 දින දක්වා අලෙවි කර නොතිබුණු අතර, එහි වටිනාකම රු. මිලියන 2.8 ක් විය.	අනාගතයේදී ගොවි සංවිධාන හරහා අලෙවි කිරීමට කටයුතු කරමි.	විධිමත් වැඩපිළිවෙලක් යොදා පොහොර අලෙවිය කඩිනම් කර තොගය මුදල් බවට පරිවර්ථනය කිරීමට පියවර ගත යුතුය.
(ඇ)	මණ්ඩූර් ගොවිජන සේවා කාරක සභාවේ බැංකු ගිණුම් 02ක තැන්පත් කර ඇති රු. 220,505 මුදල, වසර 06 සිට 19 දක්වා කාලසීමාව තුල අපේක්ෂිත අරමුණ සඳහා භාවිත නොකර නිෂ්කාර්යව පැවතුණි.	අනාගතයේදී අරමුදල් භාවිතා කිරීමට කටයුතු කරමි.	විධිමත් අනුමැතිය මත අරමුදල අදාළ අරමුණ සඳහා භාවිතා කිරීමට පියවර ගත යුතුය.
(ඈ)	වාකරයි ගොවිජන සේවා කාරක සභාවේ බැංකු සැසඳුම් වාර්තාවේ නිකුත් කරන ලද නමුත් ගෙවීමට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් වල වටිනාකම රු. 1,300,500 වූ අතර, එම මුදල් සම්බන්ධයෙන් වසර 01 සිට 05 කාලයක් ගතව ඇතත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	දිස්ත්‍රික් නියෝජ්‍ය කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු කටයුතු කරමි.	විධිමත් පරීක්ෂාවක් සිදු කර මුදල් රෙගුලාසි ප්‍රකාරව ආපසු ගෙවීමට හෝ ආදායමට බැර කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය.
(ඉ)	කොක්කට්ටිචෝලයි ගොවිජන සේවා කාරක සභාව විසින් සමාලෝචිත වර්ෂයේ ගොවි සංවිධාන විසින් එකතු කරන ලද කොළඹ කොමර්ෂල් පොහොර ආයතනය වෙත ගෙවීමට ඇති රු.6,460,725 මුදල නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.	දිස්ත්‍රික් නියෝජ්‍ය කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු කටයුතු කරමි.	විධිමත් පරිදි කටයුතු කර අදාල මුදල් නිරවුල් කිරීමට පියවර ගත යුතුය.

3.2 හඳුනාගත් පාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මණ්ඩපත්තඩි සහ එරාවූර් ගොවිජන සේවා කාරක සභාවල 2022 - 2025 කාලය තුළ, දෛනිකව එකතු කරන මුදල් කඩිනමින් බැංකුගත කිරීමට කටයුතු නොකිරීමෙන්, රු.10,154,193 ක මුදල් අක්‍රමිකතාවයක් සිදු කර තිබුණි. මේ සම්බන්ධයෙන්, මුදල් රෙගුලාසි 104(1)(ආ) අනුව මූලික විමර්ශන ආරම්භ කිරීමට 2025 මැයි මස වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	අදාළ මුදල අයකරගෙන ඇත. ඉතිරි මුදල මුදල් රෙගුලාසි අනුව අයකර ගැනීමට කටයුතු කරමි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අක්‍රමිකතාවය සම්බන්ධව පියවර ගැනීමටත්, මේ සම්බන්ධව කාලීනව කටයුතු නොකළ නිලධාරීන්ට පියවර ගැනීමත් කළ යුතුය.
(ආ)	කල්ලඩි ගොවිජන සේවා කාරක සභාව විසින් ඉදිකිරීම් තත්ත්ව පරීක්ෂාව සඳහා 2023 දී අනුමැතියකින් තොරව නිලධාරීන්ට ලබා දී තිබූ රු. 420,495 ක දිරි දීමනාව වසර 02 කට වැඩි කාලයක් ඉක්මවා තිබුණද අදාළ නිලධාරින්ගෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අයකර ගැනීමට කටයුතු කරමි.	විධිමත් පරීක්ෂාවක් කර අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2009 වසරේ පැවති ගැටළුකාරි තත්ත්වය හේතුවෙන් තාන්තාමලයි ගොවිජන සේවා කාරක සභාවේ වත්කම්වලට සිදුවූ අලාභය වන රු. 2,086,912 සඳහා පොලිසියට පැමිණිලි කර වසර 15 ක් ගත වී ඇතත් එය නිරාකරණය කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	විසඳීමට කටයුතු කරමි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, අදාළ ආයතන සමඟ සම්බන්ධ වී පරීක්ෂණ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය.
(ඈ)	පලුකාමම් ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේ රු. 3,303,500 ක් වටිනා යූරියා රසායනික පොහොර තොගයක් සම්පූර්ණයෙන්ම හානි වී තිබූ අතර හානියට පත් තොග නිසි අනුමැතියකින් තොරව තොග පොත්වලින් කපා හැර තිබුණි.	අදාළ පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරමි.	අදාළ පරීක්ෂණයක් පවත්වා අලාභයට වගකිව යුතු නිලධාරින් සම්බන්ධයෙන් පියවර ගැනීමට කටයුතු කළ යුතුය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගොවිජන සේවා විධායක කාරක සභා 10 ක දිගු කාලයක් තිස්සේ ලැබිය යුතු රු. 31,893,863 ක් වටිනා ලැබීම් අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	හිඟ මුදල අයකර ගැනීමට පියවර ගනිමි.	කාලීනව ණය ශේෂ අය නොකළ නිලධාරීන්ට පියවර ගැනීමත්, හිඟ ශේෂ අයකර ගැනීමට පියවර ගැනීමත් කළ යුතුය.

(ආ)	ගොවිජන සේවා විධායක කාරක සභා 06 ක දිගු කාලයක සිට පියවා නොමැති එකතුව රු. 5,565,492 ක මුදල පියවීමට සමාලෝචිත වර්ෂය අවසානයටත් කටයුතු කර නොතිබුණි.	මුදල පියවීමට පියවර ගනිමි.	ගෙවීමට ඇති මුදල් ගෙවා පියවීමට විධිමත් පියවර ගත යුතුය.
(ඇ)	වන්දාරුමූලයි ගොවිජන සේවා කාරක සභාවට දේශගුණික හිතකාමී වාරිමාර්ග කෘෂිකර්ම ව්‍යාපෘතිය යටතේ 2021-2022 වර්ෂවලදී රු. 4,564,456 ක් වටිනා කෘෂිකාර්මික කටයුතුවලට යොදා ගන්නා යන්ත්‍ර 10 ක් ලබා දී තිබුණ අතර, එම යන්ත්‍ර මඟින් සමාලෝචිත වර්ෂය දක්වා රු.12,000 ක ආදායමක් පමණක් උපයා තිබුණි.	ආදායම වැඩි කිරීමට පියවර ගනිමි.	විධිමත් වැඩපිළිවෙලක් යොදා ආදායම වැඩි කිරීමට පියවර ගත යුතුය.
(ඈ)	2021 වර්ෂයේ වන්දාරුමූලයි ගොවිජන සේවා කාරක සභාව වෙත ලැබී තිබූ වී වපුරන යන්ත්‍ර 02 ක් වසර 03 කට අධික කාලයක් තිස්සේ භාවිතයකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.	ඉදිරියේදී යන්ත්‍ර භාවිතා කිරීමට පියවර ගනිමි.	විධිමත් වැඩපිළිවෙලක් යොදා යන්ත්‍ර භාවිතා කිරීමට පියවර ගත යුතුය.
(ඉ)	මණ්ඩපත්තඩි ගොවිජන සේවා කාරක සභා විසින් ගොවිජන බැංකු කටයුතු ආරම්භ කිරීම සඳහා ගොවි බැංකුව වෙත ලබා දුන් රු. 607,200 ක අත්තිකාරම් මුදල වසර 05 කට වැඩි කාලයක් ගත ව ඇතත් නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අත්තිකාරම් ගෙවීමක් ලෙස ලබා දුන් මුදල් අයකර ගැනීමට පියවර ගනිමි.	අත්තිකාරම් මුදල අයකර ගැනීමට පියවර ගත යුතුය.
(ඊ)	වාකරයි ගොවිජන සේවා කාරක සභාව විසින් 2022 වර්ෂයේදී, ගොවි සංවිධාන 35කට ලබාදුන් ස්ප්‍රේයර් යන්ත්‍ර 37ක් සම්බන්ධයෙන් වසර 03 ක් ගතවී ඇතත්, ඒවා භාවිතා කරන්නේද සහ ආදායමක් උත්පාදනය කරන්නේද යන්න සොයා බැලීමට මධ්‍යස්ථානය කිසිදු අධීක්ෂණ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	අනාගතයේදී අධීක්ෂණය කිරීමට පියවර ගනිමි.	උපකරණ භාවිතය අධීක්ෂණය කිරීමට පියවර ගත යුතුය.
(උ)	කොක්කට්ටිචෝලයි ගොවිජන සේවා කාරක සභාවේ 2021 වර්ෂයේදී මිලදී ගත් රු. 417,300 වටිනාකමින් යුත් කල් ඉකුත් වූ කාබනික පොහොර මලු 401 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක් ගබඩා කර තිබුණි.	ගොවීන් කාබනික පොහොර භාවිතා කිරීම ප්‍රතික්ෂේප කිරීම නිසා ඒවා විකිණීමට නොහැකි විය.	විධිමත් පරීක්ෂාවක් සිදු කර තොග අපහරණය කිරීමට කටයුතු කළ යුතුය.
(ඌ)	කොක්කට්ටිචෝලයි ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේ	ඉදිරියේදී ලේඛනය සංශෝධනය කිරීමට පියවර ගනිමි.	කුඹුරු ඉඩම් නාම ලේඛනය සංශෝධනය

කුඹුරු ඉඩම් නාමලේඛනය සංශෝධනය සඳහා රු.500 බැගින් ගොවීන්ගෙන් රු.102,000 ක මුදලක් අයකරගෙන තිබුණද කුඹුරු ඉඩම් නාමලේඛනය සංශෝධනය කර නොතිබුණි.		සඳහා පියවර ගත යුතු අතර, ඒ සඳහා කාලීනව කටයුතු නොකළ නිලධාරීන්ට පියවර ගත යුතුය.

3.4 අරමුදල් ඌන උපයෝජනය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගොවිජන සේවා කාරක සභා 08 ක් විසින් දරිද්‍රතාවයෙන් යුත් ගොවීන්ගේ දරුවන්ට ගොවිදරු ශිෂ්‍යත්වය ලබා දීම සඳහා පරිත්‍යාග ලෙස ලද ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇති මුදල සහ එහි පොලී ආදායම වන රු.2,880,227 ක වටිනාකම දිගු කාලයක් තිස්සේ නිෂ්කාර්යව පැවතුණි.	අරමුදල භාවිතා කිරීමට පියවර ගනිමි.	විධිමත් අනුමැතිය යටතේ අරමුදල අපේක්ෂිත අරමුණ සඳහා භාවිතා කිරීමට පියවර ගත යුතුය.
(ආ)	කල්ලඩි ගොවිජන සේවා කාරක සභාවේ ගොවිපල ආශ්‍රිත කටයුතු වෙනුවෙන් පවතින ඉතිරිකිරීම් ගිණුම, ජංගම ගිණුම, ඊට අදාළ පොළී සහ අනුමත ගාස්තු ලැබීම්වල එකතු වටිනාකම වන රු. 883,498 ක ශේෂය සම්බන්ධයෙන් වසර තුනකට වැඩි කාලයක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව ගිණුම්වල රඳවාගෙන තිබුණි.	- එම -	විධිමත් අනුමැතිය යටතේ ඵලදායීව යෙදවීමට කටයුතු කළ යුතුය.
(ඇ)	ගොවිජන සේවා කාරක සභා 03 ක හරිතාගාර 3ක් සඳහා 2016 වර්ෂයේදී රු. 412,000 බැගින් රු.1,236,000 ක මුදලක් ලබා දී තිබූ අතර, එම මුදලින් රු.517,475 ක් උපයෝජනය කර නොතිබුණි.	ආදායමක් උපයා ගැනීමට හැකි සේ භාවිතා කිරීමට කටයුතු කරමි.	මුදල ඵලදායී ලෙස යොදා ගැනීමට පියවර ගත යුතුය.

3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කලුවාන්චික්කුඩි ගොවිජන සේවා කාරක සභාව විසින් සමාලෝචිත වර්ෂයේ ගොවිජන බැංකුවේ කටයුතු සඳහා රු.229,161 ක් වටිනා මුද්‍රණ යන්ත්‍රයක් සහ ස්කැනර් යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණද එම භාණ්ඩ 2025 ජුනි 13 දින දක්වා අපේක්ෂිත අරමුණ සඳහා භාවිත කර නොතිබුණි.	ඉදිරියේ දී භාවිත කිරීමට කටයුතු කරනු ලැබේ.	අපේක්ෂිත අරමුණ සඳහා වත්කම් භාවිතා කිරීමට පියවර ගත යුතුය.

(ආ)	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2016 සහ 2017 වර්ෂ වලදී ගොවිජන සේවා කාරක සභා 12 ක් සඳහා හරිතාගාර ඉදිකිරීම වෙනුවෙන් රු.4,009,037 ක ප්‍රතිපාදන වෙන් කර දී තිබූ නමුත් ඒවා ඵලදායි ලෙස භාවිතයට ගෙන නොතිබුණි.	ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු සහ ආදායම ලබා ගැනීමට නොහැකි විය .	හරිතාගාර භාවිත කර නිෂ්පාදන කටයුතු සිදු කිරීමට පියවර ගත යුතු අතර ඊට අදාළ පියවර නොගත් පාර්ශව වෙත පියවර ගත යුතුය.
(ඇ)	කරඩිනාරු ගොවිජන සේවා කාරක සභාවේ ආදායමෙන් ඉදිකරන ලද අලෙවි මධ්‍යස්ථානයට අයත් ගොඩනැගිලි සංකීර්ණය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිශ්චිත අරමුණක් සඳහා භාවිතා කිරීමට පියවර ගෙන නොතිබුණි.	නිශ්චිත අරමුණක් සඳහා එය භාවිතා කිරීමට පියවර ගනිමි.	නිශ්චිත කාර්ය සඳහා භාවිතා කිරීමට පියවර ගත යුතුය.
(ඈ)	ගොවිජන බැංකුවේ මෙහෙයුම් කටයුතු පරිගණකගත කිරීමේ අරමුණින් ගොවිජන බැංකු 05 සඳහා ලබා දී තිබූ රු.1,140,426 ක් වටිනා පරිගණක යන්ත්‍ර වසරක කාලයක් ගත වී ඇතත් භාවිතා කිරීමට පියවර ගෙන නොතිබුණි.	යථා කාලයේ දී නිශ්චිත අරමුණ සඳහා එය භාවිතා කිරීමට පියවර ගනිමි.	- එම -

3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ) සහ (ආ) ප්‍රකාරව ගොවිජන සේවා කාරක සභා 15 ක් මූලික ප්‍රසම්පාදන සැලසුම් සකස් කර නොතිබුණි.	යථා කාලයේ දි ප්‍රසම්පාදන සැලසුම සකස් කිරීමට කටයුතු කරමි.	ප්‍රධාන ප්‍රසම්පාදන සැලසුම සකස් කිරිමට කටයුතු කළ යුතුය.
(ආ)	වන්දාරුමූලයි ගොවිජන සේවා කාරක සභාව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙහි ලංසු තැබීමේ ක්‍රියා පටිපාටි අනුගමනය නොකර ප්‍රසම්පාදන කටයුතු 66 ක් සඳහා රු. 9,398,119 ක් ගෙවීම් කර තිබුණි.	යථා කාලයේ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රසම්පාදනය ක්‍රියා පටිපාටි අනුගමනය කිරීමට කටයුතු කරමි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, එසේ නොකළ පාර්ශව සඳහා පියවර ගත යුතුය.
(ඇ)	2022 දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ) සහ (ආ) මාර්ගෝපදේශයන් අනුගමනය නොකර මිලදී ගෙන තිබූ රු.1,930,000 වටිනා යූරියා මලු 100 තොගයකින් රු.1,428,200 ක් වටිනා මලු 74 ක් සමාලෝචිත වර්ෂයේ අවසාන දක්වා අලෙවි කිරීමට හෝ සැපයුම්කරු වෙත ආපසු යැවීමට කටයුතු නොකිරීම නිසා	ඉදිරියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව මිලදී ගැනීම් සිදු කිරීමට උපදෙස් ලබා දී ඇත.	විධිමත් පරීක්ෂාවක් සිදු කර ප්‍රසම්පාදනයට අදාළ පාර්ශව වෙත පියවර ගත යුතුය.

	2025 මාර්තු මස වන විට කල් ඉකුත් වී තිබුණි.		
(ඇ)	ගොවිජන සේවා කාරක සභා 03 ක් විසින් සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි අනුගමනය නොකර රු. 5,364,760 ක් වටිනා මිලදි ගැනීම් සිදු කර තිබුණි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව මිලදී ගැනීම් සිදු කරන ලෙස උපදෙස් දී ඇත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව කටයුතු කළ යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය.

3.7 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ගොවිජන සේවා කාරක සභා 10 ක වසර 05 කට වඩා වැඩි කාලයක් අඛණ්ඩව සේවය කරන ලද නිලධාරීන් 25 දෙනෙකු ස්ථාන මාරු කිරීමට පියවර ගෙන නොතිබුණි.	දැනට දිස්ත්‍රික් කාර්යාලයෙන් ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී .	මාරුවීම් ක්‍රියා පටිපාටිය නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 තිරසාර සංවර්ධන අරමුණු

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ගොවිජන සේවා කාරක සභා 17 ක් විසින් 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනත ප්‍රකාරව තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැසුම් සකස් කර නොතිබුණි.	ඉදිරි මුදල් වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට පියවර ගනිමි.	අදාළ පනත ප්‍රකාරව පියවර ගත යුතුයි.

5. ගොවිජන බැංකුව

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගොවිජන බැංකු 07 ක් විසින් සමාලෝචිත වර්ෂය සහ පෙර වර්ෂයන් තුළ ගොවීන් වෙත ලබා දෙන ලද ණය මුදල් වලින් ගොවීන් 251 දෙනෙකුට ලබා දුන් ණය මුදලේ හිඟ ණය ශේෂය වන රු.15,119,108 වටිනාකම, පොලිය සහ දඩ මුදල සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි.	අයකිරීම සඳහා පියවර ගනිමි.	කාලීනව ණය අය නොකළ පාර්ශව වෙත පියවර ගැනීමටත්, නිශ්චිත කාල සීමාව තුළ ණය අයකර ගැනීමටත් පියවර ගත යුතුය.
(ආ)	2019 ඔක්තෝබර් මස 22 දිනැති අංක 7/12/5/4 දරන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලිපිය ප්‍රකාරව බාහිර ආයතනන්හි ක්‍රියාත්මක වන ගොවි	මේ සම්බන්ධයෙන්, ගොවි සංවිධාන දැනුවත් කර මුදල් ගොවිජන බැංකුවේ බැර කිරීමට කටයුතු කරමි.	ලිපියේ උපදෙස් ප්‍රකාරව ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහනක් සකස් කළ යුතුය.

	සංවිධාන වල අරමුදල්, ගොවිජන බැංකුව වෙත බැර කරන ලෙස උපදෙස් ලබා දී ඇතත්, ගොවි සංවිධාන 17ක ශේෂයන් ගොවි බැංකු වෙත බැර කිරීමට කටයුත කර නොතිබුණි.		
(ඇ)	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2012 පෙබරවාරි 29 දිනැති අංක 4/2012 (ගො.බැ) චක්‍රලේඛයේ 4.3 වගන්තියට අනුව, ගොවිජන බැංකුවේ දෛනික මුදල් අත ඉතිරිය උපරිම වශයෙන් රු.10,000 හෝ සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ඇතිව රු.25,000 ක් පවත්වාගෙන යා යුතු බව දක්වා ඇතත් වෙල්ලාවෙලි ගොවිජන බැංකුවේ දෛනික ලැබීම් තැන්පත් කිරීමට නිසි පියවර නොගැනීම හේතුවෙන් දෛනික මුදල් අත ඉතිරිය රු.25,000 සිට රු.440,000 දක්වා වැඩි වී තිබුණි.	ඉදිරි වසරවලදී එකතු කරන ලද මුදල් දෛනිකව තැන්පත් කිරීමට පියවර ගනිමි.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගත යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය.
(ඈ)	2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 (ගො.බැ) චක්‍රලේඛයේ 3.2 (iii) අනුව ගොවීන් ලබා ගන්නා ණය මුදලින් අවම වශයෙන් සියයට 10 ක ඉතිරි කිරීම් ගොවිජන බැංකුවේ තිබීම අනිවාර්ය බව දක්වා ඇතත්, කලුවාන්චික්කුඩි ගොවිජන සේවා කාරක සභාවේ සියයට 10 ක ඉතිරි කිරීම් නොමැති ගොවීන් 33 දෙනෙකු වෙත සමාලෝචිත වර්ෂයේ දී රු.60,000 බැගින් එකතු වටිනාකම රු.1,980,000 ක කෘෂි ණය ලබාදී තිබුණි.	මින් ඉදිරියට චක්‍රලේඛ අනුව කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගනිමි.	- එම -